**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව - 2019**

----------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2019 දෙසැම්බර්31 දිනටමූල්‍යතත්ත්ව ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 සහ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවනඅභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවටසාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5. මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1හි32වගන්තියට පටහැනිවරු.101,782,470 ක් වූ ගෙවිය යුතු නියෝජිත කොමිස් ශේෂයෙන් ගිණුම්කරණ දෝෂ නිසා පැන නැගී තිබුණු රු.5,955,978 ක් වූ හර ශේෂ හිලව් කර දක්වා තිබීම හේතුවෙන් ගෙවිය යුතු නියෝජිත කොමිස් ශේෂය රු.95,826,492 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නියෝජිත කොමිස් මුදල් ගිණුම පාලක ගිණුමක් (Control Account) බැවින් හර හා බැර සටහන් දෙකම මෙම ගිණුම තුල ඇත. එබැවින් ශුද්ධ වටිනාකම ලෙස හර හෝ බැර ශේෂය දැක්වේ. | ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| **(ආ)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 2 හි 9 වගන්තියට පටහැනිව සංස්ථාව විසින් තොගවල ශුද්ධ උපලබ්ධි අගය ඇස්තමේන්තු කිරීමකින් තොරව, පිරිවැයට රු.204,516,673 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එහි භාවිතයට ගත නොහැකි රු.346,198 ක ටෝනර් වර්ග තොග ශේෂයක්ද චලනය නොවන රු.80,432 ක සංයුක්ත තැටි, ටෝනර් යනාදී තොග ශේෂයක්ද ඇතුළත් විය. | මෙම තොග පරිභෝජනය සඳහා පමණක් වන තොග බැවින් තොග ශුද්ධ උපලබ්ධි අගයට තොග ගණනය කර නොමැත.<br>තොගයේ ඇතුලත් භාවිතයට ගත නොහැකි හා චලනය නොවන තොග වටිනාකම් ඉදිරියේදී සිදු කරනු ලබන අපහරණ කටයුතු වලදී තොග වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(ඈ)** සංස්ථාවට එරෙහිව විවිධ පාර්ශවයන් විසින් රු.844,120,000 ක වන්දි මුදල් ඉල්ලා අධිකරණයේ නඩු 10 ක් පවරා තිබුණු නමුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 ප්‍රකාරව, ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. | 3.11 අසම්භාව්‍ය බැරකම් සටහන යටතේ පිටු අංක 12 හි පවරා ඇති නඩු සංඛ්‍යාව හා වටිනාකමට අදාල විස්තර දක්වා ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |
| **(ඇ)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 38හි 118 (සී) වගන්තියට පටහැනිවඅස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය වෙනුවට ශුද්ධ අගය මූල්‍යප්‍රකාශනවල දක්වා තිබූ අතර, සමුච්චිත ක්‍රමක්ෂය වටිනාකම දක්වා නොතිබුණි. | 2019 මූල්‍ය ප්‍රකාශන්හි පිටු අංක 157 හා 158 හි උපලේඛණ යටතේ අංක xxxviiiමගින් මේ පිළිබඳවිස්තර දක්වා ඇති අතර මූල්‍ය ප්‍රකාශන සංක්ෂිප්තව ඉදිරිපත් කරනු පිණිස එසේ කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |
| **(ඉ)** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 39අනුව ලංකා පුවත් ආයතනයේ කර ඇති ආයෝජනයෙහි අගය පිරිවැයට රු.1,104,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර ආයෝජන අගය අඩුවීම හෝ වැඩිවීම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම කර නොතිබුණි. | වර්තමානයේ ලංකා පුවත් ආයතනයද ක්‍රියාකාරී තත්වයේ නොපවතින බැවින් එම ආයෝජනය සාධාරණ අගයට ගණනය කිරීම අපහසු බැවින් ඓතිහාසික පිරිවැය සංකල්පය යටතේ ගිණුම්වල දක්වා ඇත. | ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |
| **(ඊ)** ශ්‍රී ලංකාමූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 13 ට අනුව ගත්මිල රු.3,315,949,586 ක්වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතා කරන දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ඒවා සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ගිණුම්කරණ ප්‍රමිතිවල දක්වා ඇති විධිවිධාන අනුගමනය කළ යුතු වේ. |

**1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ නොවැම්බර් මාසයේදී සංස්ථාවට මිලියන100 ක් වූ මූල්‍ය ප්‍රදාන ලැබී තිබුණු නමුත් එම ප්‍රදාන එම වර්ෂයේදී ක්‍රමක්ෂය කර නොතිබූ අතර 2016 වර්ෂයේදී ප්‍රදාන වශයෙන් ලද රුපියල් මිලියන 11.5 ක් වූ වාහන එම ප්‍රදාන ලැබුණු දිනයේ සිට ක්‍රමක්ෂය කර තිබුණි.ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනාවරණය කර නොතිබූ බැවින් ක්‍රමක්ෂය කිරීමේ නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකිවිය. | 2016 වර්ෂයේදී රු.මි.11.5 ක් වටිනා වාහන ප්‍රදාන වශයෙන් ලැබුණ වත්කම් බැවින් එම වර්ෂයේදී ක්‍රමක්ෂය කරන ලදී. එහෙත් 2018 වර්ෂයේදී ලැබුණ රු.මි.100 ක ප්‍රදානය වත්කම් මිළදී ගැනීම සඳහා වන අතර එම වත්කම් මිළදී ගැනීම විදේශ ආයතන මගින් කල යුතු වේ.ඒ සඳහා වන ක්‍රමවේදයට අනුව ක්‍රියා කරන විට යම් කාලයක් ගත වේ.එම නිසා 2019 වර්ෂයේ එම වත්කම් ක්‍රමක්ෂය කර ඇත. | ක්‍රමක්ෂය පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කරඒ අනුව ක්‍රමක්ෂය කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාව සතුඉතිරිකිරීමේ බැංකු ගිණුමක ගණුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ බැංකු සහ මුදල් ශේෂය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ අතර රු.1,097,793 ක වෙනසක් නිරීක්ෂණය විය. | වර්ෂ ගණනාවක සිටම ඉතිරිකිරීමේ බැංකු ගිණුමෙහි තැන්පතුවක් ලෙස ඇති මෙම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල මුදල්ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන යටතේ දක්වා තිබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදීබැංකු ගිණුම් ශේෂ, මුදල් හා මුදල් සමාන දෑ ලෙස සලකන බැවින් එම වරද නිවැරදි කළ යුතුය. |
| (ආ) මාස 06 ඉක්මවූ එකතුව රු.14,380,324 ක චෙක්පත් අවලංගු නොකිරීම හේතුවෙන් මුදල් පොතේ බැංකු අයිරා ශේෂය රු.14,380,324 ක් වැඩියෙන් සහ ණයහිමි ශේෂය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අදාළ චෙක්පත් අවලංගු කර මුදල් පොතේ ශේෂය සහ ණයහිමි ශේෂය සංශෝධනය කළ යුතුය. |
| (ඇ) 2018 වර්ෂයේදී සංස්ථාව වෙත ලැබුණු රු.මිලියන 100 ක රාජ්‍ය ප්‍රදානය මගින් සංහිඳියාවේ නාලිකාව සඳහා 2019 වර්ෂයේදී සංස්ථාව විසින් රු.75,167,126 ක උපකරණ මිලදීගෙන තිබුණු අතර මෙම උපකරණ සඳහා ක්‍රමක්ෂය ගණනය කිරීමේදී මිලදීගත් උපකරණ වටිනාකම මත ක්‍රමක්ෂය කරනු වෙනුවට සම්පූර්ණ රු.මිලියන 100 ක් වූ රාජ්‍ය ප්‍රදානය මත ක්‍රමක්ෂය ගලපා තිබීම හේතුවෙන් රු.13,454,279 කින් වෙනත් ආදායම් වැඩියෙන් සහ රාජ්‍ය ප්‍රදාන අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම් හා උපකරණ මිලදී ගැනීමේදී එහි වටිනාකම ලෙස ප්‍රාග්ධනිත වන්නේ බදු රහිත වටිනාකම වේ. එසේ වුවද ලැබුණ මුළු ප්‍රදානයට අදාල වටිනාකමට ක්‍රමක්ෂය කර ඇත. | උපකරණවල වටිනාකම පමණක් ප්‍රාග්ධනිත කර ක්‍රමක්ෂය ගණනය කළ යුතුය. |

**1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව සමුච්චිත ක්ෂය රු.3,613,433,155 ක් වූ අතර අනුරූපී වාර්තා අනුව එය රු.3,600,481,742 ක් වූයෙන් රු.12,951,413 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | වෙනසට හේතු පරීක්ෂා කර ගැලපීම් කළ යුතුය. |

## 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාවේ ශුද්ධ වත්කම් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අඛණ්ඩව අඩු වී තිබුණු අතර 2018 වර්ෂයේදී නැවතත් ශුද්ධ වත්කම් වැඩි වී 2019 වර්ෂයේදී අඩු වී තිබුණි. ඒ හේතුවෙන් භාණ්ඩාගාරයේ හෝ රජයේ මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නොමැත. | යහපත් මූල්‍ය කළමනාකරණයක් ක්‍රියාත්මක කළ යුතුයි. |

## 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) ගෙවිය යුතු නියෝජිත කොමිස් | 95,826,492 | වයස් විශ්ලේෂණය | ඉදිරි වර්ෂයේදී එසේ ඉදිරිපත් කලහැක. | ශේෂ සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) අයකර ගත නොහැකි ණයගැති ශේෂය | 80,062,377 | අයකරගත නොහැකි බව තහවුරු කරන තොරතුරු | පිළිතුරු සපයා නොමැත. | අයකරගත නොහැකි ණය ලෙස හඳුනාගැනීමට පැහැදිලි හේතු දැක්විය යුතුය. |
| (ඇ) ලංකා පුවත් ආයතනයේ ආයෝජන | 1,104,000 | කොටස් සහතිකය | පිළිතුරු සපයා නොමැත. | කොටස් සහතිකය ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංස්ථාවේ ණයදීමේ ප්‍රතිපත්තියට අනුවණයදීමේ කාල සීමාව මාස 01කට සීමා වුවද එම ණය කාල සීමාව ඉක්ම වූ ණයගැති ශේෂයරු. 414,301,517 ක් හෙවත්මුළුණයගැතියන්ගෙන් සියයට 80 ක්වූ අතර එයින්වර්ෂ 5ක්ඉක්ම වූ ණයගැති ශේෂය රු. 83,401,301 ක්හෙවත් මුළු ණයගැතියන්ගෙන් සියයට 16 ක් වී තිබුණි. | සේවාදයක ණයගැති ශේෂ අය කර ගැනීමේ කාලය මාසයක් ලෙස දක්වා තිබුණද අනෙතුක් තරහකාරී මාධ්‍ය ආයතන සේවාදායකයින්ට මාස දෙකකට වැඩි ණය සහන කාලයක් ලබාදෙන බැවින් සංස්ථාවටද එසේ කිරිමට සිදු වී ඇත. | ණයගැතියන්ගෙන් අප්‍රමාදව මුදල් අයකර ගැනීම, ප්‍රමාද කාලය මත දණ්ඩන පොලිය පැනවීම, අප්‍රමාදව නෛතික ක්‍රියාමාර්ගවලට යොමුවීම සිදු කළ යුතුය. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට දැක්වෙන මුළු ණයගැති වටිනාකමින් රු. 260,810,285 ක් හෙවත් සියයට 50 ක් රු. මිලියන 5ට වැඩි වටිනාකමින් යුත් ණයගැතියන් 14 දෙනෙකු සමඟ එළඹි ගිවිසුම් 24 ක් නියෝජනය වී තිබුණි. ඒ අතරින් 2014 වර්ෂයේ එළඹි ගිවිසුමකට අදාළව ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලැබිය යුතු රු.මිලියන 10 ක් අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබුව ද එම බැංකුව සමග නිසි පරිදි ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් ණය අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | රු.මි.10 මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සඳහා යොමු කල අතර රජයේ ආයතන දෙකක් බැවින් සාකච්ඡා මාර්ගයෙන් විසඳාගැනීමට උපදෙස් ලැබුණි. ඒ අනුව මේ සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලදී.2019.09.09 දින ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී ඉතිරිකිරීමේ බැංකුවේ ඉහළ නිලධාරියෙකු පවසා ඇත්තේ බංකුවේ ලිඛිත අනුමැතියක් සහිතව මෙම කාර්ය සිදු කර නොමැති බැවින් එයට අදාලව ගෙවීම් කිරිමට නොහැකි බවයි. | ණය අයකර ගැනීම සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඇ) ගණුදෙණුකරුවන් සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබීම, ගණුදෙණුකරුවන් හා ඔවුන්ගේ ලිපිනයන් සොයා ගත නොහැකිවීම යනාදී හේතුමත ශේෂය රු.1,382,015 ක් වූ ණයගැතියන් 05 දෙනෙකු වෙනුවෙන් වූ නීතිමය ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයාමට නොහැකිවීම නිසා සමාලෝචිත වර්ෂයේදී සියයට 100 ක්ම හානිකරණ සඳහා වෙන්කර තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ණය අයකර ගැනීම සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවට අයවිය යුතු රු.518,315,788 ක් වූ ණයගැති ශේෂයෙන් වර්ෂ 5 ක් ඉක්ම වූ ණයගැති ශේෂය රු.83,401,301 ක් වූ අතර එයින් රු. 21,590,763 ක් හෙවත් සියයට 25 ක් පමණක් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | තවදුරටත් අය විය යුතු ණය අයකර ගැනීමට විශේෂ අවධානය යොමු කර කටයුතු කරනු ලැබේ. | ණය අයකර ගැනීම සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඉ)2019 දෙසැම්බර් 31 දිනට රු.518,315,788 ක් වූ සේවාදායක ණයගැති ශේෂය තුළ ආයතනය වසාදමා ඇති හෝ අයකර ගැනීමට ප්‍රමාණවත් වටිනාකම් නොමැති නිසා හෝ කාලාවරෝධ වී ඇති හෝ වැඩිපුර උපලේඛනගතවීම් යනාදී කරුණු මත කපා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණු රු.21,461,907 ක් අන්තර්ගතව තිබුණු අතර එම ශේෂය කපාහැරීම සඳහා 2016 අගෝස්තු 24 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා තිබුණද ඒ පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නැවත විමසීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) 2019දෙසැම්බර් 31 දින වනවිට වර්ෂ 06 ක කාලය ඉකුත්වී තිබුණු ණයගැතියන් 114 දෙනෙකුගෙන් වටිනාකම රු.72,679,947ක් වූ ණය ගණුදෙණු1969අංක 68 දරන කාලාවරෝධ පනතේ 11වගන්තිය අනුව කාලාවරෝධ වීමට ප්‍රථම අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතුකර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ණය අයකර ගැනීම සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (උ)2019 දෙසැම්බර් 31 දිනට රු.518,315,788 ක් වූ සේවාදායක ණයගැති ශේෂයන්ගෙන් ශේෂ තහවුරුකිරීම සඳහා ශේෂ සනාථන ලිපි කැඳවා නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනට අදාල ණයගැති ශේෂ සනාථ කර ගැනීමේ ලිපි යැවීම මදක් ප්‍රමාද වූ අතර මේ වන විට ලිපි යවා ඇත. | සියළුම ණයගැතියන්ට අදාලව ශේෂ සනාථ කැඳවිය යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනටරු.19,598,603 ක්වූසේවාදායකණයහිමිශේෂයතුළ 2014 සහ 2015 වර්ෂයන්හිදී කරන ලද | ණයහිමි ශේෂයන්හි කාලය වර්ෂ 06 ක් ඉක්මවූ විට නෛතිකව හිමිකම් පෑමේ අවස්ථාව අහිමි වන බැවින් ඉන් පසුව | හිමිකම් පෑමේ අවස්ථා අහිමි වූ ශේෂයන් ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ප්‍රතිවෙළඳ ගනුදෙනුවලට අදාළවරු. 3,520,954 ක් වූ ණය හිමි ශේෂයක් ද ඇතුළත්වතිබුණි. මෙම ගනුදෙනුවලට අදාළව සේවාදායකයන් සමග ගිවිසුම්වලට එළඹ නොතිබීම නිසා මෙම මුදල් පිළිබඳව හිමිකම් පෑමට සේවාදායකයන්ට නොහැකි බැවින් සුදුසු ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | එම ශේෂ ආදායමට බැර කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම (රු). | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදීජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i) මු. රෙ 155**<br>2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල නිකුත් කරන ලද විගණන විමසුම් 26 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. | | පිළිතුරු ලබානොදුන් විගණන විමසුම් සියල්ල සඳහා ඉතා ඉක්මනින් පිළිතුරු ලබාදීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කළ යුතුය. |
| **(ii) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ)වගන්තිය** | | | |
| • එක් අවස්ථාවකදී ලබාදිය හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිම සීමාව රු.100,000 ක් ඉක්මවා අවස්ථා 12 කදීතත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | 6,944,462 | රාජ්‍ය චක්‍රලේඛයට අනුව අත්තිකාරම් සඳහා එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම අගය රු 100,000/- වුවද මෙම සංස්ථාවේ කාර්යය ස්වභාවය අනුව එම වටිනාකම ඉක්මවා අත්තිකාරම් ලබා දීමට සිදු වී ඇත. | සංශෝධිත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| • සිරිලකපිරි අවුරුදු සිරි 2019 වැඩසටහන සඳහා නිලධාරීන් වෙත අවස්ථා 12 කදී නිකුත්කර තිබුණු අත්තිකාරම් එකතුව රු.3,075,650 ක් දින 02 සිට දින 192 ක් දක්වා වූ කාල ප්‍රමාදයකින් පසුව පියවා තිබුණි. | 3,075,650 | රාජ්‍ය චක්‍ර ලේඛයට අනුව අත්තිකාරම් සඳහාඑක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම අගය රු 100,000/- වුවද මෙම සංස්ථාවේ කාර්යය ස්වභාවය අනුව එම වටිනාකම ඉක්මවා අත්තිකාරම් ලබා දීමට සිදු වී ඇත.මේ සම්බන්ධව සංස්ථා මණ්ඩල අනුමැතිය ලබාගෙන එය අනුමැතිය පිණිස මහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(iii) මු.රෙ.396**<br>ගෙවීමට තිබෙන සෑම චෙක්පතකම වලංගු කාලය අවසාන වූ විට එම චෙක්පත අවලංගු කර ගෙවීමටඇති ණයක් ලෙස ගිණුම් ගතකළ යුතු වුවත් 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල අවලංගු කළ චෙක්පත් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 44,388,037 | එම චෙක්පත් වල වටිනාකම් එකතුවක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ දක්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | | | |
| **(i) 2003 ජනවාරි 01 දිනැති අංක පීඊඩී 04 දරන චක්‍රලේඛය,**<br>**2011 අප්‍රේල් 29 දිනැතිඅංකපීඊඩී 58 දරන චක්‍රලේඛය හා**<br>**2015 ජුනි 17 දිනැති අංකපීඊඩී 3/2015 දරනචක්‍රලේඛය**<br>චක්‍රලේඛ විධිවිධාන නොසලකා 2010 සැප්තැම්බර් 07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් සංස්ථාවේ සභාපතිවරයාට හිමි දීමනාවට අමතරව 2010 ඔක්තෝබර් 01 දින සිට රු.30,000 ක අතිරේක සංග්‍රහ දීමනාවක් අනුමත කර තිබුණු අතර එම දීමනාව එදින සිට වර්තමානය දක්වාම මාසිකව ගෙවා තිබුණි. | 3,223,064 | සංස්ථා සභාපතිවරයාගේ මාසික දීමනාව ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කර 2010/10/01 සිට සංස්ථා මණ්ඩල අනුමැතිය සහිතව රු.30,000/= ක අතිරේක දීමනාවක් ගෙවා ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී01/2015දරන චක්‍රලේඛය**<br>• **2.3 ඡේදය**<br>ප්‍රවාහන හා ඉන්ධන දීමනාව සඳහා හිමිකම් නොමැති එම්එම් හා ජේඑම් ගණයේ නිලධාරීන් 137 දෙනෙකුට ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ගෙවා තිබුණි. | 10,208,104 | සංස්ථාව ආරම්භයේ සිට ලබා තිබූ වරප්‍රසාදයක් වන බැවින් අඛණ්ඩව ගෙවීම් සිදු කර ඇති අතර මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර ඊට අදාළ විධිමත් අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදි කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| • **3.2 ඡේදය**<br>2019 වර්ෂයේ සංස්ථාවේසේවයේ නිරතව සිටි සභාපතිවරියක සහඅධ්‍යක්ෂ ජනරාල්වරයකු ඉන්ධන ලීටර 3547 ක්, ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු සහඅධ්‍යක්ෂ (අලෙවි) ඉන්ධන ලීටර 447 ක් විධිමත් අනුමැතියකින් තොරව ලබාගෙන තිබුණි. | 645,422 | සභාපතිවරිය, අධ්‍යක්ෂ ජනරාල් හා ක්‍රියාකාරි අධ්‍යක්ෂ විසින් සැප්තැම්බර් මාසය දක්වා වැඩිපුර භාවිතා කර තිබූ ඉන්ධන සඳහා සංස්ථා මණ්ඩල අනුමැතිය ලැබී ඇත. අධ්‍යක්ෂ (අලෙවි) විසින් වැඩිපුර භාවිත කර ඇති ඉන්ධනසඳහා සංස්ථා මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| **(i) 1990 මැයි 18 දිනැති අංක 26/90 දරනචක්‍රලේඛය**<br>රජයේ ආයතනවල උත්සව කටයුතු වලදී මත්පැන් වලින් සංග්‍රහ නොකල යුතු වුවද කොළඹ හිල්ටන් හෝටලයේ පැවති නව්‍යකරණයේ අභිමංගල්‍ය වැඩසටහන සඳහා මධුසාද පිළිගැනීමේ (Cocktail Reception) උත්සවයක් පවත්වා තිබුණි.මෙම වැඩසටහන සඳහා හෝටලය තෝරාගැනීමෙදී රජයේ ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කර නොතිබුණි. | 1,700,675 | මාධ්‍ය ආයතනයක් ලෙස අනෙකුත් තරඟකාරී මාධ්‍ය ආයතන හා තරඟ කිරීමේදී සේවාදායකයින් වෙනුවෙන් උත්සව පැවැත්වීමට සිදුවේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(ii) 1998 අංක 74 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් පනත** 2018/2019 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දිය යුතු විධායක ගනයේ නිලධාරීන් 11 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි. | විධායක නිලධාරින් 11 දෙනාගෙන් තිදෙනෙකු සංස්ථා සේවයෙන් ඉවත්ව ගොස් ඇති අතර සෙසු නිලධාරින්ට සිහිකැඳවීම් යොමු කර ඇත. | පනත ප්‍රකාරව වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.8 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවවිසින්පවත්වාගෙනයන බැංකු ජංගම ගිණුම් දෙකකට අදාලව සමාලෝචිත වර්ෂයේ සෑම මසකදීම අනුමත අයිරා සීමාව ඉක්මවා තිබුණු අතර බැංකු අයිරාවන් සඳහා පොලී වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.36,540,437 ක් ගෙවා තිබුණි. | අයිරා පොලිය ගෙවීමට සිදුවන්නේ බැංකුවෙහි පවතින අයිරා ශේෂයට වන අතර මුදල් පොතේ සඳහන් ශේෂයට නොවන බවද සඳහන් කරමි. | බැංකු අයිරාව අදාළ සීමාවන් ඉක්මවා නොයන ලෙස පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.501,164,672ක අලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ලාභයරු. 188,800,669 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 689,965,341ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමටඉකුත් වර්ෂයේ ලාභය සඳහා රජයෙන් සපයන ලද ප්‍රදාන රු.479,000,000 ක්ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල පිළිබඳව සැලකීමේදී 2015 වර්ෂයේ පැවති අලාභය අඛන්ඩව අඩු වී 2018 වර්ෂයේදී රු.188,800,669 ක ලාභයක් බවට පත්ව තිබුණද 2019 වර්ෂය වන විට එය රු.501,164,672 ක අලාභයක් දක්වා වැඩි වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වර්ෂයේ ක්ෂය වීම් ගැලපීමෙන් පසු 2018 වර්ෂයේදී රු.1,325,002,743 ක් වූ දායකත්වය 2019 වර්ෂය වන විට රු.870,837,284 ක් දක්වා එනම් සියයට 34 කින් අඩු වී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

| අනුපාතය | 2019 | 2018 | 2017 | 2016 |
|---|---|---|---|---|
| දළ ලාභ අනුපාතය (සියයට) | 1 | 13 | 17 | 17 |
| ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | (27) | 11 | (10.9) | (13.6) |
| ජංගම අනුපාතය (වාර) | 1 | 2 | 1.67 | 1.98 |
| ක්ෂණික අනුපාතය (වාර) | 1 | 1 | 1.40 | 1.62 |

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ දළ ලාභ අනුපාතය සහ ශුද්ධ ලාභ අනුපාතය අඩු වී තිබුණු අතර, ජංගම අනුපාතය ක්‍රම ක්‍රමයෙන් අඩු වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ස්ථාපනය කරන ලද 1982 වර්ෂයේ සිට වසර 38 ක් පමණ ප්‍රධාන කාර්යාලය පවත්වා ගෙන යනු ලබන කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ පිහිටි අක්කර 8 ක් පමණ විශාල වූ ඉතා ඉහළ වටිනාකමකින් යුත් ඉඩම සහ ගොඩනැගිලි සංකීර්ණයෙහි නෛතික අයිතිය සංස්ථාවට ලබා ගෙන එම දේපළවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස 2016.02.24 , 2018.05.09 හා 2020.07.16 දිනැතිව අමාත්‍යාංශය වෙත ලිපි යොමුකර තිබුණද මේ දක්වා එම සාකච්ඡාව පැවැත්වී නොමැති බැවින් ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී ඇත. | දේපළපිළිබඳ නෛතික අයිතිය ලබාගෙන එම වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) සජීවී වැඩසටහනක් අතරමග නතර කිරීම නිසා මානව හිමිකම් කඩවීම, විකාශය වූ පුවත් මගින් අපහාසයන් සිදුවීම, නාට්‍ය විකාශය සඳහා අමාත්‍යාංශයට ගෙවිය යුතු බදු මුදල් නොගෙවීම, නාට්‍යයක කොටස් කිහිපයක් පමණක් විකාශයෙන් අනතුරුව විකාශය නතර කිරීම වැනි හේතූන් නිසා සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු 17 ක් පවරා තිබුණි. එයින් නඩු 10 කට අදාළව පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා තිබුණු වන්දි මුදල රු.844,120,000 ක් විය. මෙම නඩු සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට නීතිඥ ගාස්තු වශයෙන් රු.6,465,670 ක් ගෙවා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | සංස්ථාවට අලාභ සිදු නොවන අන්දමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 දෙසැම්බර් 31 දින වන විට සංස්ථාව විසින් සේවාදායක ණයගැතියන් 12 දෙනෙකුට එරෙහිව නඩුපවරා තිබුණු අතර එම නඩු මගින් සංස්ථාව අයකර ගැනීමට බලාපොරොත්තුවන මුදල රු.25,093,207 ක් විය. මෙම නඩු සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට නීතිඥ ගාස්තු වශයෙන් රු.1,521,750 ක් ගෙවා තිබුණි. | දෙසැම්බර් මස 31 වනවිටසංස්ථාව විසින් සේවාදායක ණය ගැතියන් 17 දෙනෙකුට එරෙහිව රු.25,093,207/= මුදලක් අයකරගැනීම වෙනුවෙන් විවිධ අධිකරණයන්හි නඩු පවරා ඇත. | සංස්ථාවට අලාභ සිදු නොවන අන්දමින් කටයුතු කළ යුතුය. |
| (ඈ) 2008 නොවැම්බර් 04 දින විකාශය වූ “ඉරා අඳුරු පට” නම් වූ සජීවී වැඩසටහන විකාශය අතරතුර නතර කිරීමට එරෙහිව ඒ මගින් මානව හිමිකම් ඛණ්ඩනය වූයේ යැයි පවසා රු.මිලියනයක වන්දි මුදලක් ඉල්ලමින් පුද්ගලයන් දෙදෙනෙකු විසින් සංස්ථාවට එරෙහිව නඩු පවරා තිබුණි. මෙම නඩුව සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විට නඩු ගාස්තු වශයෙන් රු.1,608,150 ක් වැය කර තිබුණු අතර වන්දි වශයෙන් ඉල්ලුම් කරන ලද මුදලටත් වැඩියෙන් නඩු ගාස්තු දරා තිබුණි. | නිරීක්ෂණයේ සඳහන් නීතිඥ ගාස්තු 2009 වර්ෂයේ සිට අසන ලද සියලුම නඩු වාරයන් සඳහා වන බව දැන්වීමට කැමැත්තෙමි. | සංස්ථාවට අලාභ සිදු නොවන අන්දමින් කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ)** ජාතික ලොතරැයි මණ්ඩලය සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සිදුකරනු ලබන ලොතරැයි දිනුම් ඇදීම විකාශය කිරීමේ ඒකාධිකාරී බලය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට හිමිව තිබුණද අදාල රාජ්‍ය ආයතන දෙක විසින් මෙම ලොතරැයි දිනුම් ඇදීම විකාශය කිරීම සඳහා පෞද්ගලික නියෝජිතයන්/අතරමැදියන් මගින් ගුවන් කාලය වෙන්කර ගැනීම සිදු කර තිබුණි. ඒ සඳහා සංස්ථාවට ලොතරැයි මණ්ඩලයෙන් ලැබෙන ආදායමෙන් සියයට 15ක කොමිස් මුදලක් අතරමැදි පාර්ශ්වයකට ගෙවීමට සිදුවන අතර ඊට අමතරව සංස්ථාවේ අලෙවි විධායකයින්ටද කොමිස් ගෙවීමට සිදුවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි ආදායම රු.687,561,590 ක් වූ අතර එම ආදායම මත වූ නියෝජිත කොමිස් රු.103,134,239 ක් හා අලෙවි විධායක කොමිස් මුදල් රු11,278,668 ක්ද ගෙවා තිබුණි. | නියෝජිත ආයතන මගින් ලොතරැයි දිනුම් ඇදීම ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට ලබාදෙනු ලබන්නේ ජාතික ලොතරැයි මණ්ඩලය හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් වන බැවින් මේ පිළිබඳව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට සෘජුව මැදිහත්විය නොහැක.<br>තවද නියෝජිත ආයතන නොමැතිව සෘජුව සංස්ථාව වෙත සම්පූර්ණ මුදල ලබා ගැනීම සම්බන්ධව අදාල ලොතරැයි මණ්ඩල දෙක වෙත 2020.07.07 දින ලිපියොමු කිරීමට කටයුතු කර ඇත. | ලොතරැයි දිනුම් ඇදීම විකාශය නියෝජිතයින්ගේ මැදිහත්වීමකින් තොරව සෘජුව සංස්ථාව වෙත ලබාගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 1982 අංක 06 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතෙහි 31 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව රූපවාහිනී නාලිකා නියාමනය සඳහා අවශ්‍ය නියෝග සකස් කළ යුතු වුවත් එම අවශ්‍යතාවයන් 2020 ජූනි වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | පිළිතුරු සපයා නොමැත. | රූපවාහිනී නාලිකා නියාමනය සඳහා අවශ්‍ය නියෝග සකස් කළ යුතුය. |
| (ඇ) 2019 වර්ෂය තුළදී ගාස්තු අයකළ යුතු එහෙත් අයකිරීමෙන් තොරව විකාශය කළ වැඩසටහන් සඳහා වූ ගුවන් කාලය පැය 100 විනාඩි 45 ක් සඳහා කිසිදු ආදායමක් සංස්ථාව වෙත ලැබී නොතිබුණු අතර මෙම වැඩසටහන්වල වටිනාකම රු.27,889,000 ක් විය. | පිළිතුරු සපයා නොමැත. | වැඩසටහන්වලට අදාල ගාස්තු අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඈ) නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් සංවිධානය කර තිබුණු ගම් උදාව ආදර්ශ ගම්මාන ජනතා අයිතියට පත්කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රචාරණ වැඩසටහන වෙනුවෙන් අයවිය යුතු රු.103,550,000 ක ගුවන්කාල ආදායමක් 2020 ජූනි වන විටත් අයකරගෙන නොතිබුණි. මෙම දැන්වීම් ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර එම වැඩසටහන් ප්‍රචාරය කරවා ගැනීම සඳහා පාර්ශ්වයන් කිහිපයකින් වරින් වර ඉල්ලීම් සිදුකර තිබුණද එම ඉල්ලීම්වල විධිමත්භාවය විගණනයේදී ගැටළු සහගත විය. | පිළිතුරු සපයා නොමැත. | ප්‍රචාරණ වැඩසටහන්වලට අදාල ගාස්තු අයකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඉ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව පෞද්ගලික ආයතනයක් සමග එළඹ තිබුණු ගිවිසුමකට අනුව ආරම්භ කරන ලද Earth Watchman ව්‍යාපෘතිය වෙනුවෙන් සංස්ථාව විසින් රු.1,720,035 ක් වැයකර සමාරම්භක උත්සවය පමණක් පවත්වා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු අනුග්‍රාහකත්වය රු.1,250,000 ක් පමණක් වූ අතර, විධිමත් අධ්‍යයනයකින් තොරව ව්‍යාපෘතිය ආරම්භකිරීම හේතුවෙන් සංස්ථාවට රු.470,035 ක අලාභයක් සිදු වී තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ඒ පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතු අතර පාඩුව වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවට අනුමත කාර්ය මණ්ඩල තනතුරු සංඛ්‍යාව ස්ථිර 1,041 ක් සහ කොන්ත්‍රාත් 08 ක් ලෙස එකතුව 1,049 ක් විය. නමුත් 2019 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්ත ස්ථිර තනතුරු සංඛ්‍යාව 898 ක් පමණක් වූ අතර එදිනට අනියම් හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන සිටින නිලධාරීන් සංඛ්‍යාව 32 ක් විය. ඒ අනුව එදිනට ස්ථිර විවිධ තනතුරුවල ඇබෑර්තු 159 ක් පැවතුණි. එසේම වැඩබලන තනතුරු 05 ක් ද ලබා දී තිබුණි. | සංස්ථාවට අනුමත කාර්ය මණ්ඩලය ස්ථිර - 1041 සහ කොන්ත්‍රාත් 08 ක් වේ. ඒවන විට ස්ථිර කාර්ය මණ්ඩලය 898 ක් කොන්ත්රාත් 19 ක් සහ සේවා පැවරුම් 13 ක් විය. සංස්ථාවේ සේවා අවශ්‍යතාවය මත වැඩබැලීමේ තනතුරු 05 ක් ලබා දී තිබේ. මේ වනවිට වැඩබැලීමේ එක් තනතුරක් අවසන් කර ඇත. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් කළ යුතුය. |
| (ආ) සංස්ථාවට කාර්ය මණ්ඩලය අනුමත කරන ලද අංක DMS/E4/37/4/231/1-1 හා 2011 ජූනි 30 දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව නොතිබුණු තනතුරු නාම 15 ක් සඳහා ස්ථිර සේවකයන් 29 දෙනෙකු, කොන්ත්‍රාත් සේවකයින් 13 දෙනෙකු සහ සේවකයන් 03 ක් කාර්ය පැවරුම් පදනම යටතේ බඳවාගෙන තිබුණි. | පිළිතුරු සපයා නොමැත. | අනුමත කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2018 ඔක්තෝබර් 01 දින සිට පුරප්පාඩුව පවතින අතර එම තනතුර පිරවීම සඳහා 2020 සැප්තැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි. | 2019 ජූනි මාසයේදී අයදුම්පත් කැඳවූවද ඉන් අනතුරුව ජනාධිපතිවරණය හා මහ මැතිවරණය ප්‍රකාශයට පත්කිරීම හේතුවෙන් බඳවා ගැනීම ප්‍රමාද විය. | තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. |